සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වයඹ මෙහෙවර මාකාණක් කල්විත් තිණෙක්කළම්
Provincial Department of Education - NWP

11ශ්‍රේණිය	දෙවන වාර පරීක්ෂණය - 2024	85 S I,II

නම: ..... ගෘහ ආර්ථික විද්‍යාව කාලය පැය තුනයි

I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ඒක පත්‍රික ගණයට අයත් වන්නේ,
1. කවුපි 2. කඩල 3. මුං ඇට 4. කුරක්කන්

02. සහල්වල අඩුවෙන්ම අඩංගු වී ඇති ඇමයිනෝ අම්ලය වනුයේ,
1. ලයිසින් 2. මෙතියොනින් 3. ලියුසින් 4. වැලින්

03. ධාන්‍ය නිවුඩ්ඩෙහි බහුලව අන්තර්ගත විටමිනයකි.
1. නියැසින් 2. ෆෝලික් අම්ලය 3. බයොටින් 4. තයමින්

04. ආහාර පිරමීඩයෙහි ඉහළින්ම දක්වා ඇති ආහාර කාණ්ඩය වනුයේ,
1. එළවළු හා පලතුරු 2. මාෂබෝග හා සත්ව ආහාර
3. තෙල් හා සීනි 4. කිරි හා කිරි ආහාර

05. නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහනෙහි ප්‍රෝටීන හා යකඩ අවශ්‍යතා දක්වා ඇති ඒකක පිළිවෙලින්,
1. මිලි ග්‍රෑම් හා ග්‍රෑම් වේ. 2. මයික්‍රෝ ග්‍රෑම් හා මිලිග්‍රෑම්
3. ග්‍රෑම් හා මිලි ග්‍රෑම් 4. ග්‍රෑම් හා මයික්‍රෝ ග්‍රෑම්

06. බිත්තර වල අඩංගු ප්‍රෝටීනයකි.
1. ජෙලටින් 2. ඇල්බියුමින් 3. මයෝසින් 4. කේසින්

07. මහා පෝෂක වලින් සිරුර තුළ ඉටුවන කෘත්‍යයන් කිහිපයක් පහත දැක්වේ.
A- ශරීර වර්ධනය සිදුකරයි.
B- ශරීර අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ආරක්ෂා කරයි.
C- ශරීරයේ ප්‍රතිශක්තිය වර්ධනය කරයි.
D- ශරීරයේ උෂ්ණත්වය පාලනය කරයි.
මේවායින් මේද වලින් ඉටුවන කෘත්‍යයන් වනුයේ,
1.A හා B ය. 2.A හා C ය. 3.B හා D ය. 4.C හා D ය.

08. කාබෝහයිඩ්‍රේට් 100 g ක් ද ප්‍රෝටීන් 20 g ක් ද මේද ග්‍රෑම් 10 g ක් ද අඩංගු ආහාර ගත් පුද්ගලයෙකුට ශරීරයට ලැබෙන මුළු ශක්ති ප්‍රමාණය වනුයේ,
1. කි.කැ. 570 යි. 2. කි.කැ. 620 යි. 3. කි.කැ. 760 යි. 4. කි.කැ. 1020 යි.

09. විටමින් ඌනතා වල රෝග ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත.
A- මලබද්ධය B- සමෙහි තුවාල ඇතිවීම C-ඇසිපිය ඉදිමීම
D-පාද හිරිවැටීම E-ආහාර අරුචිය
1. A, B හා D ය. 2. A, D හා E ය. 3. B, C හා D ය. 4. B, C හා E ය.

10. මේද ජීර්ණය ආරම්භ වනුයේ,
1. ග්‍රහණියේ දී ය. 2. ආමාශයේ දී ය. 3. කුඩා අන්ත්‍රයේ දී ය. 4. මුඛයේ දී ය.

11. පිත් යුෂ නිපදවනු ලබන්නේ,
1. අක්මාවේදී ය. 2. අග්න්‍යාශයේ දීය. 3. පිත්තාශයේ දී ය. 4. ආමාශයේ දී ය.

12. එළවළු හා පළතුරු වල අඩංගු සුදු පැහැයේ අඩංගු වර්ණය වන්නේ,
1. ෆ්ලේවොන් 2. ඇන්තොසයනින් 3. කැරටිනොයිඩ් 4. ක්ලෝරොෆිල්

13. අධිශීතකරණය තුළ මස් මාළු ගබඩා කළ යුතු උෂ්ණත්වය වන්නේ,
1. $7^{\circ}c$ 2. $18^{\circ}c$ 3. $-18^{\circ}c$ 4. $-7^{\circ}c$

14. ළදරුවෙකු සඳහා ආහාර සැකසීමේ දී සැලකිලිමත් විය යුතු කරුණකි.
1. ප්‍රෝටීන් අඩංගු ආහාර බෙහෙවින් අඩු කිරීම. 2. ලුණු හා කුළුබඩු වර්ග වැඩිපුර එකතු කිරීම.
3. තන්තු සහිත ආහාර ඇතුළත් නොකිරීම. 4. ලුණු හා සීනි පාලනය කිරීම.

15. මන්දපෝෂණයේ දී පෙන්නුම් කරන "ක්ෂයවීම" ලෙස හඳුන්වන්නේ,
1. උසට සරිලන බර නොමැතිවීම. 2. වයසට සරිලන උස නොමැතිවීම.
3. වයසට සරිලන බර නොමැතිවීම. 4. වයසට සරිලන උස හා බර නොමැතිවීම.

16. කාබෝහයිඩ්‍රේට් ජීරණ එන්සයිම පමණක් අයත් වරණය තෝරන්න.
1. මෝල්ටේස්, ඇමැයිලේස් 2. සුක්‍රේස්, පෙප්ටිඩේස්
3. ලැක්ටේස්, පෙප්ටිඩේස් 4. ලයිපේස්, කේඨමය ඇමැයිලේස්

17. ආහාර වේලක් ආසන්නයේ දී තේ පානය කිරීමෙන් මින් කුමන් ඛනිජ ලවනය අවශෝෂණයට බාධා කරයි ද?
1. යකඩ 2. අයඩින් 3. සෝඩියම් 4. සින්ක්

18. විශාල මේද ගෝලිකා කුඩා මේද ගෝලිකා බවට පත්කිරීමේ ක්‍රියාවලිය
1. ජලටනීකරණයයි. 2. කැරමලීකරණයයි. 3. තෙලෝදකරණයයි. 4. ඩෙක්ස්ටනීකරණයයි.

19. එන්ටරොකයිනේස් එන්සයිමය මඟින් සක්‍රීය වන එන්සයිමය වනුයේ ,
1. ලයිපේස් ය. 2. ට්‍රිප්සිනෝජන් ය. 3. පෙප්සීන් ය. 4. ඇමැයිලේස් ය.

20. නිරෝගී මවක් දිනකට නිපදවන මව්කිරි ප්‍රමාණය වනුයේ,
1. 650 *ml* 2. 750 *ml* 3. 850 *ml* 4. 950 *ml*

21. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව යොවුන් විය දක්වෙන කාලසීමාව වන්නේ,
1. අවු: 10-24 දක්වා 2. අවු: 10-13 දක්වා 3. අවු: 14-16 දක්වා 4. අවු: 17 -19 දක්වා

22. ස්ත්‍රී ලිංගික සහ පුරුෂ ලිංගික හෝමෝනයක් වනුයේ,
1. ඊස්ට්‍රජන් හා ප්‍රොජෙස්ටරෝන් 2. ප්‍රොජෙස්ටරෝන් හා ටෙස්ටස්ටෙරොන්
3. ටෙස්ටස්ටෙරොන් හා ඇන්ඩ්‍රොජන් 4. ඊස්ට්‍රජන් හා සුනිකා

23. ගර්භණීභාවය සඳහා ඉතාම සුදුසු වයස වන්නේ,
1. අවු: 19-30 2. අවු: 21-26 3. අවු: 20-30 4. අවු: 25 - 35

24. පූර්ව ප්‍රසව සංවර්ධනයට අදාළ ඩිම්බ අවධිය අවසන් වනුයේ,
1. ඩිම්බ කෝෂය තුළදී ය. 2. පැලෝපීය නාලය තුළදීය.
3. ගර්භාෂ ග්‍රීවය තුළදී ය. 4. ගර්භාෂය තුළදී ය.

25. මාතෘ සායනයකදී පරීක්ෂණ මඟින් හඳුනාගන්නා රෝගී තත්ත්වයකි.
මලබද්ධය 2. පාචනය 3. වකුගඩු ආබාධ 4. රුධිර පීඩනය

26. යොවුන් විය දරුවන් අතර දක්නට නොලැබෙන ලක්ෂණයකි.
1. ආත්මාර්ථකාමී බව 2. විරාඟිවන්දනය 3. අසහනය 4. ස්වාධීනත්වය කරා යාම.

27. යොවුන්විය තුළ සීඝ්‍ර කායික වර්ධනයක් සිදුවේ. යොවුන් වියේ පිරිමි දරුවෙකුගේ වර්ධන නැග්ම පෙන්වන වයස් පරාසය සාමාන්‍යයෙන්,
1. අවු: 10-12 2. අවු: 12-14 3. අවු: 14-16 4. අවු: 16-18


28. පරිනත ඩිම්බයක් සංසේචනය වනුයේ,
1. පැලෝපීය නාලයේ ඩිම්බකෝෂයට ආසන්න කොටස තුළදී ය.
2. පැලෝපීය නාලයේ ගර්භාෂයට ආසන්න කොටස තුළදී ය.
3. පැලෝපීය නාලයේ මැද කොටස තුළය.
4. ගර්භාෂය තුළය.

29. පතරොමක් රෙද්දකට පිටපත් කර ගැනීමේ දී අවශ්‍ය ද්‍රව්‍ය හා මෙවලම් වනුයේ,
1. මිනුම්පටිය, කාබන් කඩදාසි, අල්පෙනෙති සහ කතුරය.
2. අල්පෙනෙති, දූනි රෝදය, කාබන් කඩදාසි සහ කතුරය.
3. දූනිරෝදය, කතුර, පැන්සල සහ කාබන් කඩදාසිය
4. අල්පෙනෙති, පැන්සල , මිනුම් පටිය සහ කතුරය.

30. විකර්ණාකාර පටිය, ඇඳුමක කරට තබා මසා පටියෙන් අඩක් නවා, නොපිට හරවා, පළමු මැස්ම මත සිටින සේ මැසීම හඳුන්වන්නේ,
1. පෝරු වැටිය යනුවෙනි. 2. හැඩපෝරුවක් යෙදීම යනුවෙනි.
3. පයිපින් කිරීම යනුවෙනි. 4. බඳන වාටිය යනුවෙනි.

31. රෙද්දක ඇද ඉවත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සිසු කණ්ඩායමක් විසින් මෙසේ ඉදිරිපත් කරන ලදි.
A- විකර්ණාකාර දෙකෙළවරින් ඇදීම. B-රෙද්ද ආධාරකයක එල්ලා තැබීම.
C-හරස් නූලක් ඉවත්කර ඒ ඔස්සේ කපාගැනීම. D-රෙද්ද නොපිටින් මැදීම.
E-රෙද්දට ජලය ඉස සමතලා මතුපිටක එල්ලා තැබීම.
මින් නිවැරදි ක්‍රියාමාර්ග වනුයේ,
1. A, B හා C ය. 2. A, C හා D ය. 3. B, C හා D ය. 4. B,D හා E ය.

32.





රේඛා මැසීමට, මෝස්තරයක සීමා රේඛා මැසීමට හැඩතල පිරවීමට යොදා ගන්නා ඉහත සඳහන් මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,
1. දම්වැල් මැස්මය. 2. නැවි මැස්මය 3. ලේසිඩේසි මැස්මය 4. බ්ලැන්කට් මැස්මය.

33. කෙඳි වර්ගීකරණයට අයත් අර්ධ කෘතිම කෙන්දක් වනුයේ,
1. සේද 2. ටෙරලින් 3. රෙයෝන් 4. නයිලෝන්

34. ගෘහකළමනාකරණ ක්‍රියාවලියේ පියවරක් නොවන්නේ,
1. සැලසුම්කිරීම 2. පාලනය 3. ඇගයීම 4. සංවිධානය

35. පවුලේ ජීවන චක්‍රයේ අවසාන අවස්ථාව වනුයේ,
1. යොවුන් අවධිය 2. සංකෝචන අවධිය 3. වර්ධක අවධිය 4. ආරම්භක අවධිය

36. නිවසක් තැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණකි.
1. අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ 2. වැය කළහැකි මුදල
3. පොදු පහසුකම් 4. සියලු කොටස්වලින් සමන්විත වීම.

37. නිවසේ ඉටු කෙරෙන කාර්යයන් අනුව එකිනෙකට සම්බන්ධ කළ නොහැකි කාමර යුගලය වන්නේ,
1. මුළුතැන්ගෙය - කෑම කාමරය 2. නිදන කාමරය - වැසිකිළිය
3. විසිත්ත කාමරය - කෑම කාමරය 4. විසිත්ත කාමරය - නිදන කාමරය

38. පරිමාණයට අනුව ගෘහ සැලසුම් ඇඳීමේ දී කාමරයක වර්ගඵලයෙන් කොපමණ ප්‍රමාණයක් දොරක පළල සඳහා යොදා ගැනේ ද?
1. 1/7 කි. 2. 2/9 කි. 3. 3/12 කි. 4. 1/15 කි.

39. ඉටුකළ යුතු කාර්යයන් මඟ නොහැරෙන ලෙසත්, ජීවිතය, විවේකීව ප්‍රයෝජනවත් හා අසහනයෙන් තොරව සතුටින් ගත කිරීමට මනාව සැලසුම් කරගත යුතු සම්පත වන්නේ,
1. මුදල් 2. කාලය 3. ශ්‍රමය 4. ආකල්ප

40. වර්ණයක අඳුරු හෝ දීප්තිම බව,
1. වර්ණ අගමානයයි. 2. වර්ණයේ තීව්‍රතාවයයි.
3. වර්ණයේ වටිනාකමයි. 4. වර්ණ නාමයයි.

II පත්‍රය

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.**

(01) පහත දැක්වෙන සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

නාගරික පරිසරයේ සිට අධ්‍යාපනය හදාරමින් සිටින රුවිනි සති අන්තයේ තම ග්‍රාමීය නිවසට පැමිණෙන්නේ ඉමහත් ප්‍රබෝධයෙනි. ඇයට නව යොවුන් වියේ පසුවන සොහොයුරෙකු හා මූලික අධ්‍යාපනය හදාරන නැගණියක් සිටියි. තම දෙමාපියන් විසින් නඩත්තු කරගෙන යන එලින් බර වූ ගෙවත්ත තුළ තම සහෝදර සහෝදරියන් සමඟ ප්‍රීතියෙන් කාලය ගතකිරීම ඇගේ ප්‍රබෝධයට හේතුවයි. තම ගෙවත්තෙන් නෙලා ගන්නා නැවුම් එළවළු පලතුරු ආහාරයට එක්කර ගැනීමට දැඩි රුචිකත්වයක් දක්වයි.

i. ගෙවතු වගාවේ එලදාව වැඩි කිරීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 2 ක් නම් කරන්න.
ii. මූලික අධ්‍යාපනය හදාරන නැගණියට පාසල් ගෙන යාමට සුදුසු දේශීය ආහාර වර්ග 2 ක් නම් කරන්න.
iii. නව යොවුන් වියේ දරුවකුගේ ද්විතීයික ලිංගික ලක්ෂණ දෙකක් ලියන්න.
iv. මෙම ගෙවත්තේ ආකර්ශනීය බව ඇති කිරීමට "අවධාරණය" යන මෝස්තර මූලධර්මය ඉවහල් විය. ගෙවත්තේ "අවධාරණය" ඇති කළ හැකි ක්‍රම 4 ක් දක්වන්න.
v. ගෙවත්තේ සෝදා පාළුව වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.
vi. ගෙවත්තෙන් ලබාගන්නා එළවළු හා පලතුරු භාවිතයෙන් සැකසිය හැකි පරිරක්ෂිත ආහාරයක් නම් කර එය සැකසීමට භාවිත කරන අමුද්‍රව්‍ය 2 ක් නම් කරන්න.
vii. උසස් අධ්‍යාපනයේ නියුතු රුවිනිට රැගෙන යාමට සුදුසු දිවා ආහාර වේලක් සැලසුම් කරන්න.
viii. දෙමාපියන්ගේ කාර්ය බහුලත්වය නිසා නිවසේ වැඩ පහසු කරගැනීමට උපකාර කරගත හැකි උපකරණ 2 ක් නම් කරන්න.
ix. පවුල් වර්ග පිළිබඳ සලකා බැලීමේ දී මෙම පවුල තුළ දැකිය හැකි ලක්ෂණ 2 ක් ලියන්න.
x. යකඩ ඌනතාවයෙන් පෙළෙන අයෙකුට ගෙවත්තෙන් සපයාගත හැකි ආහාර වර්ග 4 ක් ලියන්න.

(02) i. ඇඳුමක් නිර්මාණයේ දී පතරොම භාවිත කිරීමෙන් සැලසෙන වාසි 03 ක් නම් කරන්න.
ii. a. ළඳරු ඇඳුම මැසීමට සුදුසු රෙදි වර්ග 4 ක් නම් කරන්න.
b. ළඳරු ඇඳුම මැසීමට පතරොම සැකසීම සඳහා අවශ්‍ය කඩදාසියේ දිග පළල සඳහන් කරන්න.
iii. මෙම ද්‍රව්‍ය, උපකරණ හා මෙවලම් අදාළ වගුවට ගොනු කරන්න.
මහන යන්ත්‍රය , දිදාලය, මිනුම් පටිය, දැතිරෝදය, රෙදි, ගම්, රිබන්, පැන්සල, ස්ත්‍රික්කය, දුඹුරු කඩදාසි, කෝඩ්, බොත්තම්

උපකරණ	මෙවලම්	ද්‍රව්‍ය

(03) i. ආහාර පිසීමේ දී ගුණාත්මක බව ආරක්ෂා කරගැනීමට සැලකිලිමත් විය යුතු කරුණු තුනක් දක්වන්න.
ii. මහළු අවධියේ පසුවන්නන් සඳහා ආහාර වේල් සැලසුම් කිරීමේ දී වැඩි අවධානයක් යොමු කිරීමට හේතු 04 ක් දක්වන්න.
iii. ආහාර පරිභෝජනයෙන් පසු මහා පෝෂක ජීර්ණයේ අවසන් ඵල වෙන වෙනම දක්වන්න.

(04) i. ආහාර නරක්වීම යන්න නිර්වචනය කරන්න.
ii. ආහාර පිළියෙල කිරීමේ ශිල්පීය ක්‍රම 06 ක් දක්වන්න.
iii. a. ප්‍රෝටීන් ශක්ති මන්දපෝෂණ තත්ත්ව පෙන්නුම් කරන රෝග තත්ත්ව දෙකක් නම් කරන්න.
b. විටමින් A ඌනතාවයේ රෝග ලක්ෂණ දෙකක් නම් කරන්න.

(05) i. ගෘහීය සම්පත් කලමනාකරණය තුළින් ඇති වාසි තුනක් ලියන්න.
ii. නිවසකට ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය මැනවින් ලබාගැනීමට භාවිතා කළ හැකි අනුයෝගී ක්‍රම 03 ක් නම් කරන්න.
iii. a. වර්ග අඩි 120 ක නිදන කාමරයක දළ සැලැස්ම අඳින්න.
b. සැලැස්ම තුළ දිශාව, දොර, ජනේලය, බිත්ති නම් කරන්න.

(06) i. "මොරියුලාව" යනු කුමක් ද?
ii. යොවුන් වියේ අවධි තුන කාල පරාස සමඟ සඳහන් කරන්න.
iii. ගර්භණී අවධියේ බලපෑම් ඇති කළ හැකි අවදානම් සාධක හතරක් සඳහන් කරන්න.

(07) i. යොවුන් වියේ දරුවන්ගේ කායික වර්ධනය පිළිබිඹු කරන ලක්ෂණ හතරක් ලියන්න.
ii. ගර්භණී මවකට යකඩ අවශ්‍යතාවය වැඩි කිරීමට හේතු වන කරුණු තුනක් ලියන්න.
iii. ගර්භණී අවධියේ දෙවෙනි හා තෙවෙනි ත්‍රෛමාසිකව විශේෂයෙන් වැඩි කළ යුතු පෝෂක 06 ක් නම් කරන්න.

ගෘහ ආර්ථික විද්‍යාව
11 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

I පත්‍රය

1 - 4	11 - 1	21 - 1	31 - 2
2 - 1	12 - 1	22 - 2	32 - 2
3 - 4	13 - 3	23 - 3	33 - 3
4 - 3	14 - 4	24 - 2	34 - 2
5 - 3	15 - 1	25 - 4	35 - 2
6 - 2	16 - 1	26 - 1	36 - 2
7 - 2	17 - 1	27 - 3	37 - 4
8 - 3	18 - 3	28 - 1	38 - 4
9 - 4	19 - 3	29 - 2	39 - 2
10 - 1	20 - 3	30 - 4	40 - 2

(1x40 = 40)

II පත්‍රය

(01) i. කොම්පෝස්ට් පොහොර සකසා ගැනීම / ඉවතලන ජලය වගාවට හැරවීම / ක්‍රමවත් ජලය පහසුකම් සලසාදීම / සිසු පිළිතුරු අනුව ලකුණු දෙන්න.

ii. බත් සහ ව්‍යංජන / ඉදි ආප්ප (හාල්පිටි) / හැලප / මුංඇට / මඤ්ඤොක්කා

iii. කිහිලි, ඉකිලි වල රෝම වැඩීම, බර වැඩිවීම, උස වැඩිවීම, සිරුරේ හැඩය වෙනස් වීම. (159)

iv. සිසුවා ලියා ඇති පිළිතුර අනුව 'අවධාරණය' මූලධර්ම පැහැදිලි වේ නම් ලකුණු ලබා දෙන්න.

v. ගල් වැටි දැමීම, පිඩලි ඇල්ලීම, අගල් කැපීම, ගස් සිටුවීම.

vi. ජෑම් / වට්නි / සෝස් / ලුණු දෙහි / සිසු පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න.

vii. සිසු පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න.

viii. ඇඹරුම් යන්ත්‍රය / පීලරය / එළවළු කපන යන්ත්‍ර / විදුලි පොල්ගාන යන්ත්‍රය / සිසු පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න.

ix. සහයෝගය / වියදම අඩුයි / තීරණ ගැනීමේ පහසුව / කරුණාව / ආදරය

x. නිවිති / සාරණ / තම්පලා / ගොටුකොළ / මුකුණුවැන්න / දිවුල් (ලකුණු: 2x10-20)

(02) i. රෙදි අපතේ යාම වළක්වා ගැනීම / ඇඳුම කැපීමේ කාර්යය ක්‍රමවත්ව කළ හැකිවීම / මූලික පතරොම මඟින් වෙනත් පන්න ගොඩනගාගත හැකිවීම./ එකම පන්නය කිහිපවරක් මැසීමේ දී රෙදි කපා ගැනීමේ පහසුව (ලෑ 03)

ii. a. මල්පීස් / ටොයිල් / ලෝන් / නෙන්සුක් / බැන්ඩේජ් රෙදි (ලෑ 02)

b. 52 cm x 52 cm (ලෑ 01)

iii.

උපකරණ	මෙවලම්	ද්‍රව්‍ය
මහන යන්ත්‍රය ස්ත්‍රික්කය	දිදාලය මිනුම්පටිය දෑතිරෝදය පැන්සල	රෙදි ගම් රිබන් දුඹුරු කඩදාසි කෝඩ් බොත්තම්

(ලෑ 04)
(පිළිතුරු දහයක්වත් නිවැරදිව ගොනුකර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)

(03) i. පිසීමේ නිවැරදි ක්‍රම භාවිතය (10 පෙළ පොතේ පිටු අංක 78) (ලෑ 03)

ii. ජීර්ණ එන්සයිම ස්‍රාවය අඩුවීම සහ ජීර්ණ ක්‍රියාවලිය දුර්වල වීම. (ලෑ 04)
මලබද්ධය ඇතිවීම / දත් දුර්වලවීම / සංවේදීතාවය අඩුවීම/ රුචිය වෙනස්වීම.

iii. කාබෝහයිඩ්‍රේට් - ග්ලූකෝස් (ලෑ 03)
ප්‍රෝටීන් - ඇමයිනෝ අම්ල
මේද (ලිපිඩ) - මේද අම්ල සහ ග්ලිසරෝල්

(04) i. ආහාරවල ආවේණික වර්ණය / වයනය / රසය / සඟන්ධය/ පෙනුම වෙනස්වීම නිසා පරිභෝජනයට නුසුදුසු තත්වයට පත්වීම. (ලෑ 03)

ii. අත්ගැසීම / මිශ්‍ර කිරීම / කලවම් කිරීම / ගැසීම / කැබලිවලට කැපීම / පදම් කිරීම. (ලෑ 03)


iii. a. කොවෝෂියෝකෝර් / මැරැස්මස් (ලෑ 02)

b.කඳුළු ග්‍රන්ථිවල ක්‍රියාකාරිත්වය අඩුවීම / බීටෝලප / ඇස් රතුවීම හා ප්‍රදාහයට ලක්වීම/ ඇසේ තුවාල ඇතිවීම සහ කාචය විනාශ වීම / සමේ නිරෝගීතාව දුර්වලවීම /අස්ථි වර්ධනයට , ශරීර වර්ධනයට හා ප්‍රජනක හැකියාවට බලපෑම් ඇතිවීම. (ලෑ 02)

(05) i. පවුලේ අවශ්‍යතා හා අපේක්ෂා ඉටුවීම / මානසික සුවය ලැබීම / අන්‍යෝන්‍ය අවබෝධ ලබාගැනීම/ පවුලේ සමගිය සහ සහයෝගිතාවය ලබාගැනීම. (ල: 03)

ii. පොකුණ හා මැද මිදුල / විදුරු උළුකැට දැමීම / වහලේ උස වැඩි කිරීම. (ල: 03)

iii.



a (ල: 02)
b (ල: 02) බැගින් (ල: 04)

(06) i. සංසේචනය වීමෙන් සෑදුන යුක්තාණුවේ සෛල බෙදීමෙන් ඇති වූ සෛල පොකුර මොරියුලාව වේ. (ල: 03)

ii. මුල් යොවුන් විය - අවු: 10-13 / මැද යොවුන් විය අවු: 14-16 / පසු යොවුන් විය අවු: 17-19 (ල: 03)

iii. දියවැඩියාව / අධිරුධිර පීඩනය / ඇඳුම / සමාජ රෝග (ල: 04)

(07) i. •අත්පා කදට වඩා වේගයෙන් වර්ධනය වීම. (ල: 04)
•ශරීර කොටස් අතර අනුපාතය අසමාන වීම.
•අස්ථි ඝනත්වයෙන් වැඩිවීම.
•ළමා ස්වරූපය ක්‍රම ක්‍රමයෙන් වෙනස් වී වැඩිහිටි ස්වරූපයක් ගනී.

ii. •මවගේ රුධිර පරිමාව වැඩිවීම. (ල: 03)
•කලලයේ රුධිර නිෂ්පාදනය වැඩිවීම.
•ප්‍රසූතියේ දී රුධිර වහනය සිදුවීම.
•කලලයේ අක්මාවේ යකඩ තැන්පත් කිරීම.

iii. ශක්තිය / ප්‍රෝටීන් / කැල්සියම් / යකඩ / සින්ක් / අයඩින් / විටමින් A (ල: 03)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank